අද
සිකුරාදා
2014-10-17

# නව වෛද්‍ය සේවා ව්‍යවස්ථාවෙන් 4000කට ශ්‍රේණි උසස්වීම්

ඉන්දික හේවාවිතාරණ

වෛද්‍ය නිලධාරීන් වෙනුවෙන් සකස් කර තිබෙනා නව සේවා ව්‍යවස්ථාවට අනුව දෙවැනි ශ්‍රේණියේ සිට පළමු ශ්‍රේණියට ඇතුල්වීම සඳහා දෙවැනි ශ්‍රේණියේ රාජකාරී කටයුතු කළයුතු වසර 20ක කාලය වසර 12ක් දක්වා අඩු කිරීම නිසා දෙවැනි ශ්‍රේණියේ සිට පළමු ශ්‍රේණියට ඇතුළත් වීමට බලාපොරොත්තුවෙන් සිටි 4000කට පසුගිය වසරේ නොවැම්බර් මාසයට බලපැවැත්වෙන ලෙස උසස්වීම් හිමිවී තිබේ.

මීට අමතරව පශ්චාත් උපාධියක් ලබාගෙන වසර 12 කින් පළමු ශ්‍රේණියට ඇතුළත් වීමට තිබූ අවස්ථාව වසර 06 දක්වා අඩුකර තිබෙන අතර, මේ අනුව පශ්චාත් උපාධිය ලබාගෙන දෙවන ශ්‍රේණියේ සේවය කරන වෛද්‍යවරුන් 1200කට පළමු ශ්‍රේණියට ඇතුළත් වීමටද අවස්ථාව හිමි වී ඇත.

මින් ඉදිරියේදී දෙවන ශ්‍රේණියේ සිටිමින් පශ්චාත් උපාධිය ලබාගන්නා අයට වසර 06 ක් තුළ අනිවාර්යෙන්ම උසස්වීම් හිමිවන අතර, වසර 12 ක් සේවය කිරීමෙන් පසු සාමාන්‍ය ක්‍රමවේදය අනුවම උසස්වීම හිමි වේ.

පශ්චාත් උපාධිය තුළින් පළමු ශ්‍රේණියට ඇතුළත් වීමට වසර 06ක් පමණක් ගත කිරීමට සිදුවීම නිසා මින් ඉදිරියට වෛද්‍ය සේවය තුළ පශ්චාත් උපාධිධාරීන් වැඩි වශයෙන් බිහිවිය හැකි බවද වෛද්‍යවරු පෙන්වා දෙති.

6/2006 වැටුප් චක්‍රලේඛයට අනුව මෙම නව සේවා ව්‍යවස්ථාව සකස් කර තිබෙන අතර එය 2013 වසරේ නොවැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක කෙරේ.